කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ව්‍යාපාර කළමනාකරණවේදී ( සාමාන්‍ය ) උපාධි
ද්වීතීය පරීක්ෂණය ( බාහිර ) - 2007

**BMGT E 2065 – සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) පහත දක්වෙන සිද්ධිය කියවා අවසානයේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

<u>නෙට්කොම් මෘදුකාංග සමාගම</u>

නෙට්කොම් මෘදුකාංග සමාගම, ව්‍යාපාර ආයතන සඳහා අවශ්‍ය වන විවිධ මෙහෙයුම් මෘදුකාංග නිෂ්පාදනය අරමුණු කරගෙන 1985 වසරේදී පිහිට වූ ආයතනයකි. මෙහි ප්‍රධාන විධායක වශයෙන් කටයුතු කරන, පරිගණක ඉංජිනේරුවකු වන සුජිත් මහතා විසින් සහයක මෘදුකාංග සංවර්ධකයින් කීපදෙනෙකු සමඟ පෞද්ගලික සමාගමක් ලෙස මෙම ආයතනය අරම්භ කරන ලදී. ආයතනයේ සියළු කටයුතු ඔහුගේ සුපරීක්ෂණය හා අධීක්ෂණය යටතේ සිදුවිය. මුලදී, ඒ ඒ පාරිභෝගිකයන්ට අවශ්‍ය වන ආකාරයේ මෙහෙයුම් වැඩසටහන් සංවර්ධනය කරමින් කටයුතු කළ අතර, තම මෘදුකාංග වල ඉහල ගුණාත්වය නිසා ක්‍රමයෙන් සමාගමේ ව්‍යාපාරික කටයුතු වර්ධනය විය. ඒ අනුව 1992 දී තම කටයුතු තවදුරටත් පුළුල් කරමින් ආයතනය සඳහා අවශ්‍යවන සම්මත මෘදුකාංග සංවර්ධනය කිරීම ආරම්භ කළේය. එම අංශයේද කටයුතු ඉක්මනින් වර්ධනය වූ අතර, සමාගමේ කටයුතු තවදුරටත් විධිමත් කිරීම සඳහා සම්මත මෘදුකාංග හා පාරිභෝගික මෘදුකාංග සංවර්ධන අංශ වශයෙන් අංශ දෙකක් ඇතිකළේය. එම අංශ සඳහා පරිගණක ඉංජිනේරුවන් දෙදෙනෙකු ප්‍රධානීන්ලෙස පත්කල අතර, ඔවුන් සුජිත් මහතාට සෘජුව වගකිව යුතු වන ලෙස සංවිධාන ව්‍යුහය සකස් කරන ලදී.

2002 වන විට සමාගමේ කටයුතු තවදුරටත් පුලුල් වූ අතර, එහිදී විශාල මෘදුකාංග සංවර්ධන සමාගම් වල උප කොන්ත්‍රාත්කරුවකු ලෙස කටයුතු කිරීම සිදුවිය. තවදුරටත් 2002 දී මෘදුකාංග අපනයනය සඳහාද සමාගම කටයුතු කළේය. මෙසේ වර්ධනය වන ව්‍යාපාරික කටයුතු හමුවේ, තවුරටත් පරිගණක ඉංජිනේරුවන් සමූහයක් බඳවා ගන්නා ලද අතර, උප කොන්ත්‍රාත් අංශය හා අපනයන අංශය ලෙස තවත් අංශ දෙකක් පිහිටුවන ලදී. ඒ සඳහාද පරිගණක ඉංජිනේරුවන් දෙදෙනෙකු ප්‍රධානීන් ලෙස බඳවා ගන්නා ලදී.

කෙසේ වෙතත්, ආයතනයේ කටයුතු තවදුරටත් පුළුල් වීම හමුවේ, තම කටයුතුවල විධිමත්භාවයත්, ප්‍රශස්ත තත්ත්වයක් පවත්වාගෙනයාමේ ගැටළුවකට සමාගම මුහුණ දී සිටියි. විශේෂයෙන් පරිගණක ඉංජිනේරුවන් විසින් වැඩි නිදහසක් හා ස්වයං

පාලනයක් සහිතව තම කටයුතු කරගෙන යාමට අවස්ථාවක් ලබාදෙන ලෙස කළමනාකරණයෙන් ඉල්ලා සිටී. ඔවුන් දක්වන්නේ දැඩි පාලන තත්ත්වයකින් හා සමීප සුපරීක්ෂකයන් යටතේ කටයුතු කරනවාට වඩා තමන්ගේ කටයුතු තමන්ම පාලනය කරගැනීමේ බලය තමන්ට හිමිවිය යුතු බවයි. ඔවුන් පෙන්වාදෙන්නේ පවතින ඉහල මධ්‍යගත, විධිමත් සංවිධාන ස්වරූපය යටතේ තම උපරිම දායකත්වය ලබාදීම ගැටළුවක් වී ඇති බවයි.

මෙය මනඃකල්පිත සිද්ධියකි.

(අ) මෙම ආයතනය දැනට අනුගමනය කරන සංවිධාන ව්‍යුහය හඳුනාගෙන, එහි දැනට පවතින තත්ත්වය අනුව එහි දක්නට ඇති දුර්වලතා මොනවාදැයි හඳුනාගන්න.

(ලකුණු 14)

(ආ) ආයතනය දැනට මුහුණපා ඇති තත්ත්වය හමුවේ, හා පරිගණක ඉංජිනේරුවන්ගේ ඉල්ලීම හමුවේ, මෙම සංවිධානයට ගැලපෙන සුදුසු ව්‍යුහයක් හේතු සහිතව යෝජනා කරන්න.

(ලකුණු 14)

(02) (අ) සංවිධාන න්‍යාය යන්න නිර්වචනය කර සංවිධාන න්‍යාය පිළිබඳ දැනුම කළමනාකරුවෙකුට වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ආ) “සංවිධානයක් ක්‍රියාත්මක භාවයේදී විවෘත පද්ධතියක ස්වරූපයකින් ක්‍රියාත්මක වේ.” මෙම ප්‍රකාශයේ පරිදි විවෘත පද්ධතියක් ලෙස සංවිධානයක දැකිය හැකි විවිධ ගති ලක්ෂණ මොනවාද?

(ලකුණු 09)

(03) (අ) සංවිධානයක ව්‍යුහයේ ස්වරූපය තීරණය කිරීමේ ප්‍රධාන නිමානයන් (Dimensions) මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ආ) සංවිධාන ප්‍රවේශයක් ලෙස ජීවන චක්‍ර ප්‍රවේශයේ ඇති කළමනාකරණ වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 09)

(04) (අ) සංවිධානයක් සම්බන්ධයෙන් පරිසර අවිනිශ්චිතතාවය (Environment Uncertainty) යනුවෙන් කුමක් අදහස්වේද?

(ලකුණු 09)

(ආ) පරිසර අවිනිශ්චිතතාවය ඇගයීම සඳහා යොදාගත හැකි සුදුසු ආකෘතියක් විස්තර කරන්න.

(ලකුණු 09)

(05) (අ) සංවිධාන සැකසීමේදී යොදාගත හැකි විවිධ විකල්ප ව්‍යුහයන් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 09)

(ආ) “වර්තමාන ව්‍යාපාරික ක්ෂේත්‍රය තුල නිලතන්ත්‍රවාදී ව්‍යුහය ඉතා බහුලව ක්‍රියාත්මක වන සංවිධාන ව්‍යුහයකි.” මෙම තත්ත්වයට හේතු වී ඇති කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(06) (අ) "සංවිධානයන් තුල කාර්යයන් ඉටුකරවා ගැනීමේදී බලය යන්න කළමනාකරුවෙකුට අත්‍යවශ්‍ය සාධකයකි."
විවිධ බල මූලාශ්‍ර පදනම්කරගනිමින් මෙම ප්‍රකාශයේ වලංගුතාවය පරීක්ෂා කරන්න.

(ලකුණු 09)

(ආ) කළමනාකරුවෙකුට බලය යෙදවීමේදී හා බලය වර්ධනය කරගැනීමේදී යොදාගත හැකි විවිධ උපාය මාර්ග විස්තර කරන්න.

(ලකුණු 09)

(07) (අ) සංවිධාන තාක්ෂණය (Organization Technology) සහ සංවිධාන ව්‍යුහය අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න.

(ලකුණු 09)

(ආ) සංවිධානයක තාක්ෂණය ඇගයීමේදී පෙරොස් විග්‍රහය (Perrow's Classification) ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 09)

(08) පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(1) සංවිධාන හා එහි ස්වභාවය
(Organizations and their nature)

(2) සාමාන්‍ය පරිසරය හා විශේෂ පරිසරය
(General and Task Environment)

(3) සංවිධාන සැකසුම හා තොරතුරු තාක්ෂණය
(Organizational Design and IT)

(4) සංවිධානයන්හි නව ප්‍රවනතා
(Modern Trends in Organizations)

(එකකට ලකුණු 6 බැගින් මුළු ලකුණු 18)